# ස්ත්‍රී දූෂණය හා සම්බන්ධ ශ්‍රී ලංකා නීතිය, එහි අර්බුද, වින්දිතයන් මුහුණ දෙන අභියෝග සහ නිර්දේශයන් හඳුනාගැනීම


ජී.පී. දුමිදු මධුෂාන්

සහාය කථිකාචාර්ය

පුද්ගල හා තුලනාත්මක නීති අධ්‍යන අංශය

නීති පීඨය

කොළඹ විශ්වවිද්‍යාලය


මිනිසා ශිෂ්ටාචාරගත වීමත් සමඟ වනචාරී යුගයේ පැවැති බොහෝ ක්‍රියාකාරකම්වලින් ඈත් වීමට හා ඈත් කරවීමට නීතිය මගින් අවශ්‍ය පසුබිම සකස් කරන ලද්දේ මානවයාගේ බාහිර හැසිරීම් පාලනය කරමින් සාමකාමී හා තෘප්තිමත් ජීවන තත්ත්වයකට අවශ්‍ය පසුබිම සකස් කිරීමේ පරමාර්ථය සහිතවය. වනචාරී යුගයේ වූ ඇතැම් ක්‍රියාකාරකම් නීතිය මැදිහත්වීමට පෙර පවා වරදක්, පිළිකුල් ක්‍රියාවන් ලෙස සලකා එවැනි ක්‍රියාවන් සිදු කිරීම වැලැක්වීමට සමාජය තුළින්ම යම් යම් ප්‍රතිපත්තිමය සාධකයන් ඇති කරගන්නා ලදි. මිනී මැරීම, ස්ත්‍රී දූෂණය, සොරකම වැනි වරදවල් අද පමණක් නොව අතීතයේ සිටම සිදු නොවිය යුතු ක්‍රියාවන් ලෙස සමාජය පිළිගන්නා ලදි. නීතිය මෙම ක්‍රියාවන් පාලනය කරමින් වැලැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගනු ලැබුවද ඇතැම් අපරාධ වර්තමානය වනවිට ක්‍රමක්‍රමයෙන් අඩුවනු මිසක වැඩිවීමක් පෙන්නුම් කරනුයේ මානවයා නැවතත් වනචාරී යුගයට ගමන් කරන්නේදෝයි යන සැකය ජනිත කරමිනි. ඉහතින් සඳහන් කරන්නට යෙදුණු මිනි මැරීම, ස්ත්‍රී දූෂණය හා සොරකම වැනි වරදවල් අපරාධ නීතියට අයත් වන අතර අපරාධයක් හුදෙක් එක් අයෙකුට හෝ පුද්ගලයන් කීප දෙනෙකුට සිදු කළද එය මුළු මහත් සමාජයටම එරෙහිව සිදු කරනු ලැබූ වරදක් ලෙස සළකා අදාළ අපරාධය සිදුකළ අපරාධකරුට දඬුවම් ලබා දේ. මෙහිදී අපරාධයක් යනු සමස්ත සමාජයටම එරෙහිව සිදුකරනු ලැබූ වරදක් නිසා රජය විසින් නඩු පවරා අදාළ අපරාධකරුට දඬුවම් නියම කරනු ලබයි.

මෙහි ලා ස්ත්‍රී දූෂණය නම් අපරාධමය වරද පිළිබඳව සාකච්ඡා කරනු ලබන අතර වත්මන් සමාජයේ පවත්නා දැඩි අර්බුදයක් වන ස්ත්‍රී දූෂණ අපරාධ වැඩිවීමට හේතු, ඊට නීතිය කෙසේනම් මැදිහත්විය යුතු වන්නේද? එහි වින්දිතයන් මුහුණ දෙන අභියෝග හා ඊට ගෙන ආ යුතු සංශෝධන විග්‍රහ කරමින් ඉදිරිපත් කිරීම අපේක්ෂිතය.

ස්ත්‍රී දූෂණයක වින්දිත පාර්ශ්වය වන්නේ එහි නාම මාත්‍රයෙන්ම ස්ත්‍රියයි. ස්ත්‍රීන් වනාහි අනතුරට ලෙහෙසියෙන්ම භාජනය වියහැකි පුද්ගල කොට්ඨාසයක් ලෙස නීතිය මඟින් නිශ්චිතවම හඳුනාගෙන තිබේ. ඒ අනුව ස්ත්‍රීන්ගේ ආරක්ෂාව හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරනු වස් නීතිය මඟින්ම විශේෂ ආරක්ෂාවක් ලබා දීමට පියවර ගෙන තිබේ. නමුත් එම ආරක්ෂාවන්ගේ ඇති අප්‍රමාණවත් බව හෝ ක්‍රියාකාරීත්වයේ ඇති දුර්වලතාවයන් නිසා ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් කඩවීම් නිරන්තරයෙන් දැකගත හැකිය. 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව කිසිම තැනැත්තෙකු වදහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන්සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය. නමුත් ස්ත්‍රී දූෂණයකදී සිදුවන්නේ

බලහත්කාරයෙන් අප්‍රසන්නතාවය දනවමින් අමානුෂික ලිංගික සංසර්ගයකි. මේ හේතුවෙන් 11 ව්‍යවස්ථාවේ ආරක්ෂණය අභිමිවීයාමක් බව සඳහන් කළ හැකිය.

ස්ත්‍රී දූෂණය පිළිබඳ නෛතික අර්ථ නිරූපණය ලබා දෙන්නේ 1883 අංක 02 දරන දණ්ඩ නීති සංග්‍රහයේ 363 වගන්තියයි. මෙම 363 වගන්තිය 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතින් ප්‍රතිශෝධනය කරන ලදි. ඊට අනුව ස්ත්‍රී දූෂණයක් යනු,

මිනිසෙක් පහත විස්තර කර ඇති අවස්ථා අතරින් යම් අවස්ථාවකට, අයත්වන පරිවේෂණ යටතේ, ස්ත්‍රියක සමඟ මෛථූනයෙහි යෙදේ නම් ඔහු "ස්ත්‍රී දූෂණය" සිදු කළේ යයි කියනු ලැබේ.

(අ) ඒ ස්ත්‍රිය තමාගේ භාර්යාව වන අවස්ථාවක වුව ද ඇය ඔහුගෙන් නීති මාර්ගයෙන් වෙන් වී සිටියද ඇගේ කැමැත්ත නොමැතිව;

(ආ) බලහත්කාරය පාවිච්චි කිරීමෙන් හෝ තර්ජනය කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන් හෝ ඇයට මරණ බය හෝ තුවාල සිදු කිරීමේ භය ඇති කිරීමෙන් හෝ ඇය නීති විරෝධි ලෙස රඳවා තබාගෙන සිටියදී හෝ ඇගේ කැමැත්ත ලබාගෙන ඇති විට, ඇගේ කැමැත්ත අතිව;

(ඇ) ඇය සිහිවිකලව සිටියදී හෝ ඒ පුරුෂයා විසින් හෝ නැතහොත් වෙනත් යම් තැනැත්තෙකු විසින් ඇයට දෙන ලද මද්‍යසාර හෝ මත්ද්‍රව්‍ය මඟින් ඇති කරන ලද මත් අවස්ථාවක ඇය සිටියදී, ඇගේ කැමැත්ත ඇතිව;

(ඈ) තමා ඇගේ ස්වාමිපුරුෂයා නොවන බව ඒ පුරුෂයා දැන සිටි අතර ඇගේ කැමැත්ත දෙන ලද්දේ ඇය හා නීත්‍යානුකූලව විවාහ වී සිටින හෝ ඇය හා නීත්‍යානුකූලව විවාහ වී ඇතැයි ඇය විශ්වාස කරන වෙනත් පුරුෂයෙකු ඒ පුරුෂයා යයි ඇය විශ්වාස කිරීම නිසා බව ඒ පුරුෂයා දන්නා විටකදී, ඇගේ කැමැත්ත ඇතිව;

(ඉ) ස්ත්‍රිය වයස අවුරුදු දොළහට වැඩි වන්නා වූ ද එම පුරුෂයාගේ භාර්යාව වන්නා වූ ද සහ ඇය එම පුරුෂයාගෙන් නීති මඟින් වෙන් වී නොමැති නම් මිස, ස්ත්‍රිය වයස අවුරුදු දහසයට අඩු වන විට ඇයගේ කැමැත්ත ඇතිව හෝ නැතිව.

මීට අනුව ස්ත්‍රී දූෂණයක් සිදුවිය හැකි අවස්ථාවන් පහක් නිශ්චිතව හඳුනාගත හැකිය.

**කැමැත්ත යන සාධකය පසුපස ඇති තාර්කිකත්වය**

ඉහත අවස්ථා පහේම කේන්ද්‍රගත සාධකය ලෙස ස්ත්‍රියගේ **කැමැත්ත** පිළිබඳ සාධකය දැක්විය හැකිය. ස්ත්‍රියකගේ කැමැත්ත රහිතව, කැමැත්තට විරුද්ධව, හුදු කැමැත්ත මත සිදුවන ලිංගික සංසර්ගයන් ස්ත්‍රී දූෂණය නම් අපරාධමය වරද යටතට වැටේ. මෙහිදී, බලෙන් හෝ රැවටීමෙන් ස්ත්‍රියගේ කැමැත්ත ලබා ගැනීමට නොහැකිය. මන්ද එසේ ලබා ගන්නා කැමැත්ත වලංගු, සත්‍ය කැමැත්තක් නොවන නිසාය. 363 වගන්තිය දක්වන පරිදි ස්ත්‍රියගේ කැමැත්ත යන සාධකය නොයෙක් ආකාරයෙන් බලපානු ලැබේ. එය ආකාර තුනක් යටතේ විස්තර දැක්විය හැකිය. එනම්,

ඇගේ කැමැත්ත නැතිව, ඇගේ කැමැත්ත ඇතිව හා ලබාගත් කැමැත්ත ඇතිව යන කොටස් යටතේය. මෙහිදී මෙම කොටස් තුන යටතට 363 වගන්තියේ දක්වන අර්ථ විග්‍රහය විශ්ලේෂණය කර බැලීමේදී, නීතිය මඟින් වෙන් වූ භාර්යාව සමඟ **ඇගේ කැමැත්ත නැතිව** සිදුවන ලිංගික සංසර්ගය ස්ත්‍රී දූෂණයක් ලෙස සළකනු ලැබේ. සිහිවිකලව සිටිය දි, මත් බවට පත් කර ඇති විටකදී හෝ තමා ඇගේ ස්වාමිපුරුෂයා බව ව්‍යාජ ලෙස අඟවමින් **ඇගේ කැමැත්ත ඇතිව** සිදුවන ලිංගික සංසර්ගයද ස්ත්‍රී දූෂණයක් ලෙස සැළකේ. එසේම, බලහත්කාරය පාවිච්චි කිරීමෙන්, බිය ගැන්වීමෙන්, රඳවා තබා ගැනීමේ තර්ජනයෙන්, මරණ භය ඇති කිරීමේ තර්ජනයෙන්, මරණ භය ඇති කිරීමෙන්, තුවාල සිදුකිරීමේ භය ඇති කිරීමෙන්, නීත්‍යානුකූල ලෙස රඳවා තබා ගෙන සිටියදී, නීති විරෝධී ලෙස රඳවා තබාගෙන සිටියදී යන අවස්ථාවලදී **ලබාගත් කැමැත්ත ඇතිව** යන කොටස ආවරණය කරනු ලැබේ. එමෙන්ම වයස අවුරුදු දහසයකට අඩු ස්ත්‍රියක් සමඟ ඇගේ කැමැත්ත ඇතිව හෝ නැතිව සිදු කරනු ලබන ලිංගික සංසර්ගයද ස්ත්‍රී දූෂණයක් ලෙස අර්ථ දක්වා තිබේ.

ඒ අනුව ඉහත සඳහන් විශ්ලේෂණය මඟින් ස්ත්‍රී දූෂණයකදී කැමැත්ත යන සාධකය ප්‍රමුඛතම සාධකය වන අතර එය විවිධාකාරයෙන් අර්ථ දක්වා එහි අදාළත්වයේ වපසරිය නිශ්චය කර තිබේ. කැමැත්ත යන සාධකයේ තාර්කික පසුබිම නම්, ස්ත්‍රිකගේ සත්‍ය කැමැත්තකින් තොරව අන් සෑම විටකම ස්ත්‍රී දූෂණයක් විය හැකි බවයි. නමුත් සත්‍ය කැමැත්ත යන සාධකයද තව දුරටත් සීමා කරමින් දක්වන්නේ ඇයව රැවටීමෙන් ලබාගන්නා සත්‍ය කැමැත්ත සහිතව සිදුකරනු ලබන ලිංගික සංසර්ගයද ස්ත්‍රී දූෂණයක් වන බවයි. මන්ද කැමැත්ත යන සාධකය එහිදී සත්‍ය වශයෙන්ම ලබාගත් කැමැත්තක් නොවන නිසාය. මෙහිදී ස්ත්‍රීය සිය කැමැත්ත ලබා දෙනුයේ සත්‍ය පසුබිම නොදැනීම මතය. එවන් විටක ඇය ලබා දෙන කැමැත්ත වලංගු කැමැත්තක් ලෙස සලකා චූදිතයාට නිදහස් විය නොහැක්කේ එය ස්ත්‍රිය විසින් සත්‍ය පසුබිමෙහි ස්වරූපය නොදැනීමේ හා එහි ප්‍රතිඵල ඇයට පූර්වානුමාන කිරීමේ නොහැකියාව මත ලබා දෙන කැමැත්තක් නිසාවෙනි.

කැමැත්ත යන සාධකය ඔප්පු කිරීමේදී අදාළ ස්ත්‍රී දූෂණය සිදු වූයේ වින්දිත තැනැත්තියගේ කැමැත්තකින් තොරව සිදු වූ බවට හඳුනා ගැනීම උදෙසා අදාළ ලිංගික සංසර්ගයේදී ඇය ප්‍රතිරෝධය පෑමේදී ඇයට සිදු වූ තුවාල, සීරීම්, ඇගේ ඉරීගිය ඇඳුම්, පොර බැදුවේ නම් එම ස්ථානයේ සළකුණුද, එසේම චූදිතයාට සිදු වූ තුවාල එනම් වින්දිත තැනැත්තිය විසින් චූදිතයා වෙත එල්ල කළ පහරවලින් වූ තුවාල, සිරීම්, නියපොතු පහරවල් වැනි සාක්ෂ්‍යද අදාළ කර ගත හැකිය. මන්ද කැමැත්තකින් අදාළ ලිංගික සංසර්ගය සිදු වූයේ නම් එවන් ආකාරයේ ප්‍රතිඵලයන් හට නොගන්නා බැවිණි. බොහෝ ඉංග්‍රීසි නඩු තීන්දුවලදී ස්ත්‍රීය ප්‍රතිරෝධය දැක්වූ බව ඔප්පු කිරීමට සිදු වූ තුවාල පිළිබඳව අවධානය යොමු කර තිබෙන අතර එහිදී වින්දිත ස්ත්‍රියගේ ශරීරයේ තුවාල නොතිබුණේ නම් අදාළ ලිංගික සංසර්ගය ස්ත්‍රියගේ කැමැත්ත ඇතිව සිදුවූවාය යන්න තීරණය කිරීමට අධිකරණය ක්‍රියාකළ ආකාරයන් දැකිය හැකිය. මේ හේතුව නිසා ශ්‍රී ලංකා නීතිය තුළ 363 වගන්තියේ සඳහන් දෙවන පැහැදිලි කිරීමට අනුව, **"ශරීරයට සිදු වී ඇති ශාරීරික තුවාල වැනි ප්‍රතිරෝධය පිළිබඳ සාක්ෂි සංසර්ගය සිදු වී ඇත්තේ කැමැත්ත නොමැතිව බව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය නොවේ"** යනුවෙන් දක්වා තිබීම මඟින් එය අදාළ වින්දිත තැනැත්තියගේ වාසියට පවතින්නක් ලෙස පෙනී යයි. එනෙක් අතට එහිදී අදාළ සංසර්ගය සිදු වූයේ ස්ත්‍රීයගේ සත්‍ය කැමැත්ත මත වන විටකදී යම් කිසි ප්‍රයෝගකාරී චේතනාවක් මත අදාළ ස්ත්‍රියට නිර්දෝෂී

පුරුෂයෙකුට වුවද අදාළ ස්ත්‍රී දූෂණ චෝදනාව එල්ල කිරීමේ හැකියාවක් පවතින බවට තර්ක කළ හැකිය.

කැමැත්ත යන සාධකය පදනම් කර ගනිමින් ස්ත්‍රී දූෂණයක් සංස්ථාපනය වීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමේ තවත් එක් පදනමක් ලෙස සමාජ් විද්‍යාත්මක පැතිකඩක් හඳුනාගත හැකිය. මෙහිදී, කැමැත්ත හා එකඟත්වය යන අවස්ථාවන් වඩාත් වැදගත් වනුයේ හොඳින් කතා බස් කරමින්, එකිනෙකා හඳුනාගනිමින් ඔවුනොවුන්ගේ ගෞරවය හා අවංකත්වය සුරකිමින් සිදුකරන්නා වූ ලිංගික සම්බන්ධතාවයන් වඩාත් හොද පුද්ගල සම්බන්ධතාවයන්ට මඟ විවර කිරීමක් වේ. ශාරීරික අවශ්‍යතා පිළිබඳ තමාගේ සහකාරියගෙන් විමසා දැන ගැනීමෙන් ඇගේ ගෞරවය මෙන්ම පුරුෂයාගේ ගෞරවයද සමාජය ඉදිරියේ අපකිර්තියට ලක් වීම් වැළකේ. ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා හා ලිංගිකත්වය පිළිබඳ සමාජය තුළ ධනාතමක ආකල්පයක් වර්ධනය වේ. සහකරුවෙකුට හෝ සහකාරියකට තමාගේ සහකාරිය හෝ අනෙකා කෙරෙහි අයිතියක් නොමැති බව පිළිගත යුතු අතර ඔවුන්ගේ ශරීර තමන්ට අයිති වන්නා වූ භාණ්ඩ ලෙස පරිහරණය කිරීමට නොහැකි බවක් මින් අවබෝධ කරගත යුතු වේ. එසේම, තමන්ගේ ශරීරය හා ලිංගිකත්වය තවත් අයෙකුට අයිති දෙයක් ලෙස නොසැලකිය යුතුය. මෙමඟින් ස්ත්‍රී පාර්ශ්වයේ බොහෝ අයිතීන් පවා සුරක්ෂිත කරගැනීමට උපකාර කරගත හැකිය. එමෙන්ම කාන්තාවන් ලිංගික ක්‍රියාවලින්ට එකඟකරවාගැනීමෙදී ඇගේ කැමැත්ත විමසීම ඉතා යහපත් වන අතර එය ස්වභාවිකද වන්නේය. මේ අනුව මෙකී ක්‍රියාවන්ගෙන් හා ආකල්පයන්ගෙන් තොරව සිදු කරනා ලිංගික සංසර්ගයන් ස්ත්‍රියගේ කැමැත්ත නොමැතිව සිදුවන ලිංගික සංසර්ගයන් වන අතර එය අදාළ පුද්ගලයන් අතර පමණක් නොව සමස්ත සමාජයේම ප්‍රගමනයට අත්‍යන්තයෙන්ම බාධා පමුණුවයි.

**කාලිමුත්ත**[i] නම් නඩුවේදී ස්ත්‍රී දූෂණය නම් වරද සංයුත්ත වීමට කැමැත්ත නොතිබුණේද යන්න තීරණය කළ යුතු ආකාරය පිළිබඳව අධිකරණය දක්වා තිබුණි. ඒ අනුව, හුදෙක් අවනත වීම කැමැත්ත ලෙස අදහස් කළ නොහැකි බවත් ක්‍රියාවේ ස්වභාවය හා ප්‍රතිඵලය දැන ගැනීම, කැමැත්ත දීම සඳහා පූර්වාවශ්‍යතාවක් බව දැක්විණි. කිසියම් ස්ත්‍රියක් ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම් වූ ක්‍රියාවේ ස්වභාවය හා එහි ප්‍රතිඵල දැන ඊට එකඟ වී නම් ඇගේ කැමැත්ත ලැබී යැයි කිව හැකි බව අධිකරණය දක්වා ඇත. ඒ අනුව කැමැත්ත යන සාධකය අධිකරණය විසින් මනාව විග්‍රග කර තිබේ.

කැමැත්ත පිළිබඳ සාධකයේදී ඉත වැදගත් නඩු තීරණයක් වන්නේ **ඉනෝකා ගාල්ලගේ එදිරිව කමල් අද්දරාරච්චි සහ අනෙක් අය**[ii] නඩුවයි. මෙහිදී අදාළ ලිංගික සංසර්ගයට කැමැත්ත ප්‍රකාශ නොවූ බ ඔප්පු නොවූ නිසා විත්තිකරු නිදහස් විය යුතු බව අභියාචනයේදී තීරණය විය. මෙය ප්‍රතිරෝධය පැම්ම සම්බන්ධයෙන්ද වැදගත් වන අතර එහිදී දූෂණය වූ තරුණිය අදාළ අවස්ථාවේදී බලවත් ප්‍රතිරෝධයක් පෑ බව කියා සිටියද ඒ බව කිසිදු සාක්ෂියක් නොතිබුණි. අවම වශයෙන් සීරීම් තුවාලයක් වත් ඇගේ ශරීරයේ නොතිබුණු අතර වඩාත්ම ආන්දෝලනාත්මක කරුණ වූයේ දූෂණය වූවා යැයි පැවසූ තරුණිය තවදුරටත් කන්‍යාවක් බව වෛද්‍ය පරීක්ෂණයේ සාක්ෂි මඟින් සනාථ වීමයි.

**නල්ලයියා එදිරිව හේරත්**[iii] හි දී වයස අවුරුදු 16 ට අඩු දැරියක් ඇගේ කැමැත්ත ඇතිව මිත්තණියගේ භාරයෙන් පිටතට ගෙන ගොස් ඇයට ලිංගිව අතවර කිරීම සම්බන්ධයෙන් චූදිතයාගේ

තර්කය වූයේ ඒ සඳහා ඇයගේ කැමැත්ත තිබූ බවයි. නමුත් අධිකරණය එම තර්කය ප්‍රතික්ශේප කරමින් අවුරුදු 16 ට අඩු දැරියගේ කැමැත්ත නොසළකා හරින ලදි. **<u>රජින</u> එදිරිව <u>ෂයිට් ඇඩම්</u>**[iv] නඩුවේදී ද අවුරුදු 16 න් පහළ වයස්කාරියගේ කැමැත්ත සළකා නොබලන ලදි.

කැමැත්ත යන සාධකය ඔප්පු කිරීමේදී දූෂණයට ලක්වූ අදාළ තැනැත්තිය එම සිදුවීම සම්බන්ධව පොලිසියට සිදු කරනු ලබන පැමිණිල්ලද ඉතා වැදගත් කමක් දරයි. එනම්, අදාළ දූෂණය සිදු වූ විගසම හෝ ඊට ආසන්න කාලයකදී අදාළ සිදුවීම සම්බන්ධව පොලීසියට පැමිණිලි ඉදිරිපත් කළේ නම් එහිදී එම ස්ත්‍රී දූෂණය ඇගේ කැමැත්තට විරුද්ධව සිදු වූ ලිංගික සංසර්ගයක් බවට අනුමාන කිරීමට හැකියාවක් ඇත. මන්ද ඇයගේ කැමැත්ත රහිතව එය සිදු වූ හෙයින් ඒ පිළිබඳව පැමිණිලි කිරීමට ඇය තුළ පැවති අවශ්‍යතාවය හා උනන්දුව ඒ තුළින් ගම්‍යමාන වන බැවිණි. යම් හෙයකින් අදාළ දූෂණය සිදු වී බොහෝ වේලාවකට පසු එනම් සැලකිය යුතු කාල පරාසයකට පසු ඇය ඒ පිළිබඳව පැමිණිලි කරන්නේ නම් එහිදී අදාළ ලිංගික සංසර්ගයට කැමැත්තක් තිබුණාය යන සාධාරණ සැකය ජනිත කිරීමට සමත් වන නිසා එය විත්තියට වාසියක් විය හැකිය. මෙහිදී ඉදිරිපත් කළ හැකි ප්‍රති තර්කයක් වන්නේ අදාළ ස්ත්‍රිය එම සිදු වීම වූ අවස්ථාවේම පොලීසියට පැමිණිලි නොකළේ ඇයට සිදු වූ අවමානය මුළු මහත් සමාජයම දැන ගැනීමෙන් ඇය සමාජ අපකීර්තියට ලක්වීමට හැකියාවක් ඇතැයි සිදු වූ නිසාවෙන් බව දැක්විය හැකිය. එම නිසා අධිකරණය විසින් අදාළ නඩුවේ සිද්ධිමය සාධක මත මනා අවධානයක් යොමු කරමින් සත්‍ය අනාවරණය කර ගැනීමට ක්‍රියා කළ යුතුය.

**වෛවාහක ස්ත්‍රී දූෂණය (Marital rape)**

වෛවාහක ස්ත්‍රී දූෂණය යනුවෙන් හඳුන්වන්නේ විවාහක ස්වාමිපුරුෂයා විසින් සිය විවාහක භාර්යාවගේ කැමැත්ත රහිතව ඇය සමඟ ලිංගික සංසර්ගයේ යෙදීමයි. මෙහිදී වෛවාහක ස්ත්‍රී දූෂණය සිදුවනුයේ වෛවාහක පාර්ශ්වයන් අතර වන අතර මෙහිදී භාර්යාවගේ ලිංගික අයිතිවාසිකම් ඇයගේ කැමැත්ත යන සාධකය පදනම් කරගෙන සුරක්ෂිත කර තිබේ. ශ්‍රී ලංකානු නීතිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී දණ්ඩ නීති සංග්‍රහයට 1995 අංක 22 දරන සංශෝධනය හරහා වෛවාහක ස්ත්‍රී දූෂණය හඳුන්වා දෙන ලද්දේ 363(අ) වගන්තිය ලෙසිණි. නමුත් මෙහිදී අවධාරණය කළ යුත්තේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ චේතනාව වූයේ විවාහය පවතින අතරතුරදී භාර්යාවගේ කැමැත්ත නොමැතිව සිදුවන ලිංගික සංසර්ගය වෛවාහක ස්ත්‍රී දූෂණය ලෙස නම් කිරීම නොව වෛවාහක පාර්ශ්වයන් සිය විවාහය අවලංගු වී නැති නමුත් නීතිය ඉදිරියේ වෙන් වීමක් සිදු වී ඇති විට ස්ත්‍රියගේ කැමැත්ත නොමැතිව සිදුවන ලිංගික සංසර්ගයන් සඳහා පමණි. ඒ අනුව පොදුවේ අනෙක් රටවල පිළිගන්නා පුළුල් පරාසයක මෙන් නොව හුදෙක් අධිකරණමය වෙන්වීමකදී පමණක් වෛවාහක ස්ත්‍රී දූෂණයක් සිදුවන බවයි. 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත හරහා වෛවාහක ස්ත්‍රී දූෂණයේ වින්දිතයන් හට යම් ආකාරයක ආරක්ෂාවක් ලබා දේ. නමුත් මෙම ආරක්ෂාව වත්මන්ව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉහතින් සාකච්ඡා කළ වෛවාහක ස්ත්‍රී දූෂණ අර්ථයෙන් වෙනස් වූවකි. මෙහිදී විවාහය තුළ සිදුවන ස්ත්‍රී දූෂණයකදී එනම්, භාර්යාවගේ කැමැත්ත නොමැතිව සිදුවන ලිංගික සංසර්ගයකදී/ලිංගික බලහත්කාරකමකදී එහි වින්දිත තැනැත්තියට 2005

අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනතේ ප්‍රතිපාදන හරහා මහේස්ත්‍රාත් අධිකරණයට ආරක්ෂාව සම්බන්ධයෙන් ඉල්ලීමක් අළ හැකි අතර එමඟින් අපරාධකරු හා වින්දිතයා අතර පවතින සම්බන්ධතාවය සීමා කිරීමට ලක්කළ හැකිය.[v]

නමුත් අවධාරණය කළ යුත්තේ වෙනත් රටවල පවතින ආකාරයට විවාහය තුළදී, එනම්, ශ්‍රී ලංකාවේ පවතින සීමා සහිත ප්‍රවේශය වන අධිකරණමය වෙන්වීමකදී පමණක් සිදුවන වෛවාහක ස්ත්‍රී දූෂණය ඊට පමණක් සීමා නොකර විවාහය තුළදී භාර්යාවගේ කැමැත්තකින් තොරව සිදුවන ලිංගික සංසර්ගයද වෛවාහක ස්ත්‍රී දූෂණය නැමැති තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය නීතිමය සංශෝධනයන් සිදු කළ යුතුය.

### ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (Statutory rape)

දණ්ඩ නීති සංග්‍රහයට ගෙන ආ 1995 අංක 22 දරන සංශෝධනය ප්‍රකාරව ව්‍යවස්ථාපිත දූෂණයට අදාළ නෛතික තත්ත්වය ස්ථාපිත කරන ලදි. එහිදී 363(ඉ) වගන්තිය සැළකීමේදී, ස්ත්‍රිය වයස අවුරුදු 12ට වැඩි වන්නා වූද එම පුරුෂයාගේ භාර්යාව වන්නා වූ සහ එම පුරුෂයාගෙන් නීති මඟින් වෙන් වී නොමැති නම් මිස ස්ත්‍රිය වයස අවුරුදු දහසයකට අඩු වන විට ඇයගේ කැමැත්ත ඇතිව හෝ නැතිව ඇයව දූෂණය කිරීම ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය ලෙස හඳුනාගෙන ඇත. මෙහිදී වයස අවුරුදු 16ට අඩු ගැහැණු ළමයින් සමඟ ඔවුන්ගේ කැමැත්ත ඇතිව හෝ නැතිව සිදුකරනු ලබන ලිංගික සංසර්ගය ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය ලෙස සළකයි. මෙහිදී ඇතිවන ගැටළුකාරී තත්ත්වය වන්නේ පොදුවේ ලෝකය පිළිගනු ලබන්නේ අවුරුදු 18ට අඩු සියල්ලන් ළමයින් ලෙසයි.[vi] නමුත් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සාමාන්‍යයෙන් නිසඟයෙන්ම අරමුණු කරගනුයේ ළමුන්ව දූෂණය කිරීමෙන් වළක්වා ගැනීම පිළිබඳවයි. එහෙත් ශ්‍රී ලංකාවේ 363(ඉ) ප්‍රතිපාදනය ප්‍රකාරව වයස අවුරුදු 16ට අඩු ගැහැණු ළමුන් පමණක් ආරක්ෂා කරන අතර තවමත් ළමයින් ලෙස පොදුවේ සළකන්නා වූ වයස අවුරුදු 16ත් 18ත් අතර ගැහැණු ළමයින් ඊට අයත් නොවීම අර්බුද රාශියක් ඇති කරන්නකි. විශේෂයෙන්ම ලිංගික කටයුතු සඳහා කැමැත්ත ලබා දීමේ වයස අවුරුදු 16 ලෙස දැක්වුවද පොදු නීතිය යටතේ විවාහ වීමට හැකි වයස අවුරුදු 18 වේ. මෙහිදී යම් අර්බුදයක් ඇත්තේ වයස අවුරුදු 16ට අඩු ගැහැණු ළමයෙකුට එම වයසේදී ලිංගික කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා දීමට හැකි වුවත් වයස අවුරුදු 18 වනතෙක් විවාහ වීමට හැකියාවක් නොමැති වීමයි. එබැවින් මෙම තත්ත්වය පිළිබඳව හා එහි ප්‍රායෝගික අර්බුදයන් විමර්ශනය කරමින්, සළකා බලමින් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයේ වයස් සීමාව වයස අවුරුදු 18 වන විවාහ වීමේ අවම වයස දක්වා ඉහළ දැමීම කාලෝචිත විසඳුමක් වන්නේය.

### රඳවා තබාගැනීමකදී සිදුවන ස්ත්‍රී දූෂණය/භාරකාරත්ව ස්ත්‍රී දූෂණය (Custodial rape)

1995 අංක 22 දරන සංශෝධනයෙන් දක්වනුයේ නීති විරෝධි ලෙස රඳවා තබාගෙන සිටියදී ඇගේ කැමැත්ත ලබාගෙන ඇති විට ඇගේ කැමැත්ත ඇතිව සිදු කරනු ලබන ලිංගික සංසර්ගය මීට

අයත්වන බවයි. නමුත් මෙම ප්‍රතිපාදනය 1998 අංක 29 දරන සංශෝධන පනතින් ඉවත් කර වත්මන්ව පනවා ඇත්තේ නීති විරෝධීව හෝ නීත්‍යානුකූලව රඳවා සිටියදී ලබා ගත් කැමැත්ත ඇතිව ලිංගික සංසර්ගයේ යෙදීම ස්ත්‍රී දූෂණයක් වන බවයි. මීට පෙර නීතිවිරෝධී රඳවා තබා ගැනීමකදී පමණක් සීමා වූ මෙම තත්ත්වය වත්මන්ව නීත්‍යානුකූලව රඳවාගෙන සිටියදී වන ලිංගික සංසර්ගය දක්වා පුළුල් කර ඇත. මීට හේතු වී ඇත්තේ නීත්‍යානුකූලව අත් අඩංගුවට ගන්නා සැකකාරියක්, හා බන්ධනාගාරයක් තුළ නීති ප්‍රකාරව රඳවාගෙන සිටින සිරකාරියන් වැනි ස්ත්‍රීන් ඔවුන්ගේ කැමැත්ත ඇතිව ලිංගික සංසර්ගයට භාජනය කිරීම ස්ත්‍රී දූෂණයක් ලෙස සළකන නිසාය. එබැවින් ඒ හරහාද ස්ත්‍රී දූෂණයක් විය හැකි ආකාරයන් පුළුල් කිරීමක් ලෙස හඳුනාගත හැකිය.

**රංචු ගැසී සිදුකරන ස්ත්‍රී දූෂණය (Gang rape)**

රංචු ගැසී ස්ත්‍රී දූෂණය කිරීම යන වරද ස්ත්‍රී දූෂණයේ අමානුෂික හා වඩාත් බරපතල අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. මෙහිදී සිදු වන්නේ එක් අයෙකු පමණක් නොව කීප දෙනෙකු එක් වී අදාළ ස්ත්‍රිය දූෂණයට ලක් කිරීමයි. මීට අදාළ නීතිමය තත්ත්වය 364 (2)(උ) යටතේ දක්වා තිබේ. මෙහි පළමු පැහදිලි කිරීමට අනුව

"තැනැත්තන් කණ්ඩායමක එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් විසින් ස්ත්‍රී දූෂණය පිළිබඳ වරද සිදු කරනු ලැබූ අවස්ථාවක ඒ වරද සිදු කළ හෝ වරද සිදු කිරීමෙහි ලා අනුබල දුන් ඒ කණ්ඩායමේ එක් එක් තැනැත්තා රංචු ගැසී ස්ත්‍රී දූෂණය කළේ යැයි සළකනු ලැබේ."

මෙහිදී අවධාරණය කළ යුත්තේ අදාළ දූෂණය සිදුකළ යුතු පුද්ගලයන් ගණන නිශ්චිතව දක්වා නොමැති වුවද එය එක් අයෙකුට වඩා වැඩි එනම්, දෙදෙනෙක් හෝ ඊට වැඩි පුද්ගලයන් ගණනක් විසින් සිදු කරනු ලැබිය හැකිය. මෙහිදී වැදගත්ම කරුණ වන්නේ අදාළ ස්ත්‍රී දූෂණයට සහභාගී වූවන්, එනම් ස්ත්‍රී දූෂණය කළවුන් හා ඊට අනුබල දුන් අයවලුන්ද අදාළ ස්ත්‍රී දූෂණය කිරීමේ වරදට වරදකරුවන් කිරීමට හැකි වීමයි. ඒ බව **<u>රීටා ජෝන් නඩුවේදී</u>**[vii] සනාථ විය.

**<u>සංජීව</u> එදිරිව <u>නීතිපති</u>**[viii] හිදී චූදිතයන් සිව්දෙනෙකුට විරුද්ධව රංචු ගැසී ස්ත්‍රී දූෂණය කිරීම පිළිබඳව අධි චෝදනා පත්‍ර ගොනු කරන ලදි. එහි අභියාචනයේදී ශ්‍රේෂ්ඨාධිකරණය රංචු ගැසී සිදු කරනු ලබන ස්ත්‍රී දූෂණය සම්බන්ධව මෙවන් විග්‍රහයක් ඉදිරිපත් කරන ලදි. එනම්, මෙය 1995 අංක 22 දරන සංශෝධනයෙන් ශ්‍රී ලංකා නීතියට එක් වූ අංගයක් වන අතර එකී සංශෝධන පනතේ අර්ථ දැක්වීම්වල එන නීතිය එම වරද සම්බන්ධව ඍජුවම ආදේශ වියයුතු බවයි. පවත්නා නීති තත්ත්වය අනුව රංචු ගැසී ස්ත්‍රී දූෂණයක් කරන ලද විටක පොදු අරමුණකින් යුතුව එනම් පොදු චේතනාවෙන් අදාළ චූදිතයන් ක්‍රියාකළ බව ඔප්පු කිරීම අවශ්‍ය නොවේ. මේ හේතුව නිසා ස්ත්‍රී දූෂණයට ක්‍රියාකාරීව හවුල් නොවූ පර්ශ්වකරුවකු වුවද කණ්ඩායම සමඟ එකව සිට ක්‍රියා කිරීම නිසා අදාළ වරදට කෙළින්ම වගකීමට ලක්වනු ඇත. ඉතා මෑතකදී වූ සිදුවීමක් වන යාපනයේ සමූහ දූෂණයකට ලක්ව මියගිය විද්‍යා සිසුවියගේ ඛේදවාචයද මෙම රංචු ගැසී ස්ත්‍රී දූෂණයට අයත් වේ.[ix] එසේම මේ ආකාරයෙන් වන ස්ත්‍රී දූෂණ අසල්වැසි ඉන්දියාවේද බහුලව දැකගත හැකි අතර එමඟින් වෛද්‍ය සිසුවියන්, නීති සිසුවියන් මෙන්ම බොහෝ ස්ත්‍රීන් මෙම ස්ත්‍රී දූෂණයන්හි වින්දිතයන් වී හමාරය.[x]

## ස්ත්‍රී දූෂණ නඩුවක අධිකරණ ක්‍රියාදාමයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීත්වයේ අවශ්‍යතාවය

ස්ත්‍රී දූෂණයද අපරාධයක් වන බැවින් අපරාධ නීතියේ ඔප්පු කිරීමේ මිනුම් දණ්ඩ වන සාධාරණ සැකයකින් තොරව අපරාධකරුගේ සදෝශීභාවය ඔප්පු කළ යුත්තේය. මෙහිදී සාක්ෂි මෙහෙයවීම අතිශය තීරණාත්මක සාධකය වන අතර එමගින් නඩුවේ තීරණය දෝලනයට ලක් වේ. මෙසේ සාධාරණ සැකයකින් තොරව සාක්ෂ ඉදිරිපත් කිරීමේදී අදාළ වින්දිත තැනැත්තිය අතිශය අසරණභාවයට පත්වන ආකාරයක්[xi] දැකිය හැක්කේ අදාළ ස්ත්‍රී දූෂණය සිදු වූ අවස්ථාවේ වූ සියලුම සිදුවීම හා ක්‍රියාදාමය විවෘත උසාවියේදී ප්‍රකාශ කළ යුතු නිසාවෙනි. මෙම තත්ත්වය සළකා බලන විට විශේෂයෙන්ම ශ්‍රී ලංකාව යනු ආසියාතික රටක් වන අතට කාන්තාවන්ගේ ගෞරවය හා සමාජ තත්ත්වය පිළිබඳව දැඩි ලෙස විමසිලිමත් වන ස්වභාවයක් මත පදනම් වේ. එහිදී අදාළ දූෂණයට ලක් වූ ස්ත්‍රිය මේ වන විටත් දැඩිලෙස කායික හා මානසික පීඩාවන්ට ලක්ව අසරණව සිටින අවස්ථාවකදී නැවතත් ඇයගෙන් එම අප්‍රසන්න සිදුවීම් පිළිබඳව ප්‍රශ්න කිරීම හරහා ඇය අධිකරණය ඉදිරියේ නැවත වරක් දූෂණයවීමක් සිදු වනවා වැන්නය. මෙහි බරපතලකම වන්නේ මුල් අවස්ථාවේදී අදාළ චූදිතයා ඉදිරියේ සත්‍ය ලෙස දූෂණයට ලක් වූ ස්ත්‍රියට අධිකරණය ඉදිරියේ නඩු විභාග අවස්ථාවේදී සියල්ලන්ම ඉදිරියේ ව්‍යංග ලෙස නැවතත් මානසික වශයෙන් දූෂණයට ලක්වීමයි. නමුත් අපරාධ යුක්ති ක්‍රමයේ අත්‍යාවශ්‍ය ක්‍රියාදාමයන් ප්‍රකාරව මෙසේ සිදු කරනුයේ යුක්තිය ළඟා කර ගැනීමට වුවත් එය මීට වඩා ස්ත්‍රී පුරුෂ සංවේදීභාවයකින් යුක්ත නවමු ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන්නේ නම් එහිදී ස්ත්‍රී දූෂණයට ලක් වූ කාන්තාවගේ ගෞරවය හා ආත්ම විශ්වාසය නංවාලමින් ඇයව නැවතත් සමාජ සංස්ථාවට යෝග්‍ය කිරීමට පහසු වනු ඇත. එය අපරාධ යුක්ති ක්‍රමය බලාපොරොත්තු වන එක් අරමුණක් ලෙසද අර්ථ විග්‍රහ කළ හැකිය. මීට අදාළ වගකීම නීති නිර්මාපකයන්, අධිකරණ විනිසුරන්, නීතිය ක්‍රියාත්මක කරන පොලිස් නිළධාරීන් මෙන්ම නීතඥයන් සතුවන අතර කාන්තාවන් සතු ආවේණික අවදානම් සහගතභාවය සළකා බලමින් මනා සංවේදීභාවයකින් යුක්තව ඇති විය හැකි අනාගත ප්‍රතිවිපාකයන් පිළිබඳව මනා දැනීමකින් යුක්තිය ඉටු කිරීම සඳහා ක්‍රියාකාරීව සහභාගී විය යුතුය.

## ස්ත්‍රී දූෂණ සිදුවීම් අවම කිරීමට වත්මන්ව පවත්නා දඬුවම් ප්‍රමාණවත් වේද?

දණ්ඩ නීති සංග්‍රහයේ 364 වගන්තියට අනුව වසර 20 දක්වා උපරිමය වූ සිරදඬුවක්, දඩයක් හා වින්දිතයා වෙනුවෙන් වන්දියක් ගෙවීමට අධිකරණයට නියම කිරීමේ බලය ඇත. නමුත් වත්මන්ව පවත්නා ශීඝ්‍රයෙන් වැඩිවන ස්ත්‍රී දූෂණ අපරාධමය සිදුවීම් දෙස බලන විට හා ඒවායෙහි ස්වභාවය, කෲරත්වය සළකන විටදී මෙම දඬුවම් ප්‍රමාණවත් නොවන බව සමාජය තරයේම ප්‍රකාශ කර සිටී. බොහෝ විටදී සිදුවන්නේ අදාළ ස්ත්‍රී දූෂණය අවසානයේදී ඝාතනයට ලක් කිරීමයි. එසේත් නැතහොත් ස්ත්‍රී දූෂණයේ කෲරත්වය, බරපතලකම හා අමානුෂිකත්වය මත ඇය ඝාතනය නොකළත් ජීව් සාධක මත ඇය ස්වභාවිකවම මරණයට පත් වීමයි. යථාදෘෂ්ටිකවාදී නීතිවේදියෙකු වූ ජෝන්

ඔස්ටින් සිය නීතිය පිළිබඳ න්‍යායේ පදනම කර ගනුයේ දණ්ඩණයට ඇති බියයි. එනම් මිනිසා නීතියට අවනත වනුයේ නීතියට ඇති බිය නිසා බව අවධාරරණය කරන අතර මෙහිදී එම න්‍යාය තවදුරටත් සළකා බලමින් ස්ත්‍රී දූෂකයන්ට ඔවුන් සිදුකර ඇති ස්ත්‍රී දූෂණයේ බරපතලකම, කෲරත්වය යන සාධකයන් සළකා බලමින් වඩා වැඩි දඩුවම් ලබා දිය යුත්තේ වරදේ සමානුපාතිකත්වය සළකමින් හා සමාජය ඒ දෙස හෙළන දෘෂ්ටීන් සම්බන්ධවද යම් ආකාරයක අදහස් ලබාගෙනය. මෙහිදී අධිකරණය සතුව ඇඩි වගකීමක් ඇති අතර විනිසුරන්ට නිර්මාණාත්මක කාර්යභාරයක් සිදු කිරීමට ක්‍රියා කළ හැකිය. එය සමාජයේ අභිවෘද්ධිය උදෙසා භාවිත කරමින් අනාගත ස්ත්‍රී දූෂකයන්ගේ උත්සාහයන් යටපත් කරනු වස් සුවිශාල වගකීමක් ඉටු කරනු ඇත. ඒ අනුව ස්ත්‍රී දූෂණ නඩුවලදී ඊට වගකිව යුතු අපරාධකරුවන්ට මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා වන සිරදඬුවමකට යටත් කළ යුතුබව බොහෝ පිරිසක් දරන මතය වන්නේය.

**ස්ත්‍රී දූෂණයක වින්දිතයෙකු මුහුණ දෙන සමාජීය, ශාරීරික, මානසික හා ආර්ථික අභියෝග.**

ස්ත්‍රිය වනාහි ස්වභාවයෙන්ම අවදානමට භාජනය වන තැනැත්තියකි. එබැවින් ඔවුන්ට විශේෂ ආරක්ෂාවක්, සැළකිල්ලක් ලබා දීම අත්‍යාවශ්‍ය වන්නේය. ස්ත්‍රී දූෂණයක වින්දිතයා වන්නේ ස්ත්‍රියකි. එබැවින් අදාළ ස්ත්‍රී දූෂණයෙන් පසුව ඇය සතු ස්වභාවික අවදානම් සහගතභාවයට එහා ගිය අවදානමකට ඇයට මුහුණදීමට සිදු වේ. එම තත්ත්වයන් සාමාජීය, මානසික, ශාරීරික හා ආර්ථික ලෙස වර්ගකළ හැකිය. ස්ත්‍රී දූෂනයක වින්දිත කාන්තාවක් මුහුණ දෙන සාමාජීය අර්බුදයන් වන්නේ අපකීර්තියයි. සමාජ ගෞරවය ඇයට අහිමි වී ගොස්ය. ඇය මේ වන විට අදාළ අපරාධකරු ඉදිරියේ පමණක් නොව සමස්ත සමාජය ඉදිරියේම තමන්ගේ ගෞරවය අහිමි කරගෙන ඇත. එසේම සමාජ සම්බන්ධතාවන් පළුදු වී හෝ අහිමිවී ගොස් තිබිය හැකිය. ඇය විවාහ නොවූ කාන්තාවක් නම් ඇයට විවාහ වීමට අවශ්‍ය ගෞරවය, හැකියාව අහිමි වී ගොස් ඇති ලෙස සමාජය සැලකිය හැකිය. ඇය විවාහක නම් ඇයගේ විවාහ ජීවිතය කඩා කප්පල් වීමට ලක් විය හැකිය. ඇය පාසල් යන ගැහැණු ළමයෙකු නම් ඇයගේ අධ්‍යාපනයට හා අනාගත ජීවිතයට එය අත්‍යාවශ්‍යයෙන්ම බලපෑම් එල්ල කරනු ඇත. ජනමාධ්‍ය හරහා ස්ත්‍රී දූෂණ සිදුවීම ප්‍රසිද්ධ වී ඇතිනම් ඇයගේ සමාජ තත්තවය හා ගෞරවය අභියෝගයට ලක් වී හමාරය. සමාජ අපහාසයන් හා නොපිළිගැනීම් අභිමුව එම වින්දිත ස්ත්‍රිය ඇතැම් විට සියදිවි නසා ගැනීමට පවා පෙළඹිය හැකිය. එසේම එම වින්දිත ස්ත්‍රියගේ පවුලටද සමාජය හමුවේ ඇඩි අභියෝගයන්ටද මුහුණ දීමට සිදුවිය හැකිය. එබැවින් එය ප්‍රාථමික වින්දිතයන් පමණක් නොව ද්විතියික වින්දිතයන් දක්වාද විහිදී යන අර්බුදයකි. මානසික අර්බුදයන් පිළිබඳව සඳහන් කිරීමේදී අදාළ ස්ත්‍රී දූෂණය ස්ත්‍රියගේ කැමැත්තට විරුද්ධව සිදුව ඇති නිසා එමගින් ඇයගේ මනසට ඇඩි හානියක් ඇතිවීම ස්වභාවික වන තර ඇගේ හැඟීම්වවලටද යථාවත් කළ නොහැකි පරිදි හානී සිදු වේ. එම හේතුවෙන් මානසික අවපීඩන තත්ත්වයන් වුවද ඇති විය හැකි අතර මානසික සංවර්ධනය නොසිතන ආකාරයකින් පහත වැටිය හැකිය. මෙයද ප්‍රාථමික වින්දිතයාගෙන් ඔබ්බට ගොස් ඇගේ පවුලේ උදවියගේද මානසිකත්වයට ඇඩිව බලපෑම් කිරීම හරහා ද්විත්යික වින්දිතයන් ද නිර්මානය වේ. ශාරීරික අර්බුදයන් පිළිබඳව දැක්වීමේදී අදාළ බලහත්කාරී ලිංගික සංසර්ගය හේතුවෙන් ඇය ගැබ් ගැනීමකට වුවද ලක්විය හැකිය. එය අනපේක්ෂිත හා ස්වේච්ඡාවෙන් තොරව සිදු වූ ගැබ් ගැනීමක් වන හෙයින් එම ගැබ ගබ්සා කිරීමට වුවද නීතියෙන්

ඉඩක් නොමැති බැවින් ඇය ඒ සඳහා ශාරීරිකව වන්දි ගෙවිය යුතු වේ. එලෙස උපදින දරුවාගේ සුජාතභාවය හා අනාගතය, ආරක්ෂාව හා ආදරය පිළිබඳව ගැටලු ඇතිවිය හැකිය. එසේම ස්ත්‍රී දූෂණයේදී සිදු වූ තුවාල හේතුවෙන් ඇයට කෙටිකාලීන හෝ දීර්ඝකාලීන රෝගාබාධයන්ට ඇයට මුහුණදීමට සිදු වනු ඇත. ආර්ථික ගැටලු ලෙස අදාළ ස්ත්‍රිය රැකියාවක් කරමින් සිටියේ නම් හෝ රැකියාවක් අපේක්ෂාවෙන් සිටියේ නම් ඇයගේ මෙම පශ්චාත් වාතාවරණයන් හමුවේ එම රැකියා අවස්ථාවන් අහිමිව යනු ඇත. එසේම ඇයට සිදු වූ ශාරීරික හා මානසික හානි සඳහා මූල්‍යමය අගයකින් එහාට ගිය හානි පවා අනිවාර්යෙන් සිදු වේ. එබැවින් මේ ආකාරයට ස්ත්‍රී දූෂණයක වින්දිත කාන්තාවට බලපාන අර්බුදයන් නීති නිර්මාපකයන් හෝ අදාළ බලධාරීන් විසින් මනාව අවබෝධ කරගනිමින් ඒ සඳහා අවශ්‍ය පිළියම් ඉතා ඉක්මණින් විධිමත්ව ක්‍රියාත්මක කළ යුතු වන්නේය.

**ස්ත්‍රී දූෂණ සිදුවීම් අවම කරගැනීමට ශ්‍රී ලංකා නීති දේහයට ඉදිරිපත් කළ හැකි යෝජනා**

ඉහතින් සාකච්ඡා කරන්නට යෙදුණු ස්ත්‍රී දූෂණය සම්බන්ධ අපරාධයේ වර්ධනය වීම වළක්වා ගැනීම උදෙසා හා ඊට වරදකරුවන් වන අයවලුන්ට උචිත දඬුවම් ලබා දීමට පහත සඳහන් නිර්දේශ යෝජනා කළ හැකි වන්නේය.

- ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය වයස අවුරුදු 18 දක්වා ඉහළ දැමිය යුතු අතර එහි අපරාධකරුවන්ට මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා වන සිර දඬුවම් ලබා දිය යුතුය.
- වෛවාහක ස්ත්‍රී දූෂණය අධිකරණමය වෙන්වීමකදී පමණක් නොව විවාහය පවතින අවස්ථාවලදී පවා භාර්යාවගේ කැමැත්තට පටහැනිව සිදුවන ලිංගික සංසර්ගයන් සඳහාද අදාළ කළ යුතුය.
- ස්ත්‍රී දූෂණ නඩු කටයුතුවලදී ස්ත්‍රී පාර්ශවයට අවමන්සහගත වන ආකාරයේ සාක්ෂි මෙහෙයවීම් පාලනය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන් සකස් කිරීම.
- විනිශ්චයකාරවරුන්ට, නීතිඥයන්ට හා පොලිස් නිළධාරීන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාවය සම්බන්ධව අනුගමනය කළ යුතු මාර්ගෝපදේශයන් හඳුන්වා දීම හා එම මාර්ගෝපදේශයන් අනුගමනය කරන බවට සහතික වීම.
- ස්ත්‍රී දූෂණ නඩුවලදී අවසන් අධිකරණ තීරණය කඩිනමින් සාධාරණ කාලයක් තුළ ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන සකස් කිරීම.
- ස්ත්‍රී දූෂණයක වින්දිත කාන්තාවට මුහුණ පෑමට සිදුවන පශ්චාත් වාතාවරණයන්ට හා අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට හැකිවන පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම.
- ස්ත්‍රී දූෂණයේ බරපතලකම, කෲරත්වය හා අමානුෂිකත්වය සළකමින් ඊට සමානුපාත දඬුවම් ලබා දීම. එය මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලෙසද අනිවාර්ය කළ යුතුය.

ඉහත සඳහන් නිර්දේශයන් අදාළ බලධාරීන් ක්‍රියාත්මක කිරීම කිරීම හරහා අපරාධ යුක්ති ක්‍රමයේ අභිමතාර්ථයන් සහ ස්ත්‍රී දූෂණ සම්බන්ධ සිදුවීම් අවම කර ගනිමින් සමාජ සුරක්ෂිතභාවය තහවුරු කරගනිමින් අන්‍යෝන්‍ය ගෞරවය හා අයිතිවාසිකම් සුරක්ෂිත කරගත හැකි සාමකාමී සමාජයක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය පසුබිම උදාවනු ඇත. එසේම මෙහි වගකීම හුදෙක් රාජ්‍ය අංශයට පමණක් නොව සමාජයේ වෙසේන පුරවැසියන්ගේද වගකීමක් ලෙස සලකා කටයුතු කිරීම මෙවන් අපරාධයන්ගෙන් මිදීමට අත්‍යාවශ්‍ය සාධකයන් වන්නේය.

---

[i] නිලන්ත හෙට්ටිගේ, අපරාධ නීතියේ මූලධර්ම, සමාධි ප්‍රකාශකයෝ, 55 පිටුව
[ii] (2002) 1 SLR 307
[iii] 54 NLR 473
[iv] (1988) 8 Suprime Court Case 161
[v] Available at http://www.impowr.org/content/current-legal-framework-rape-and-sexual-assault-sri-lanka
[vi] Article 01, Convention on the Rights of the Child, 1989
[vii] Available at http://www.sundaytimes.lk/990606/plus4.html
[viii] නිලන්ත හෙට්ටිගේ, අපරාධ නීතියේ මූලධර්ම, සමාධි ප්‍රකාශකයෝ, 61 පිටුව
[ix] Available at http://www.sundaytimes.lk/150607/news/schoolgirl-13-sexually-abused-in-jaffna-152339.html
[x] Available at http://www.ndtv.com/topic/medical-student-rape
[xi] Gunasekara S, CEDAW Commitmnts: A Progress Review Sri Lanka, Centre for Women’s Research, 2011, 09 pg